**මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - 2021**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය/ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කරන ලද වටිනාකම රු.3,819,928 ක් වූ ගොඩනැගිලි 03 ක් සමාලෝචිත වර්ෂයේ වත්කම් ලෙස ගිණුම්ගත කිරීමේදී ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට බැරකර තිබුණි. | සමුච්චිත අරමුදලට බැර කර තිබූ මෙම වටිනාකම ප්‍රාග්ධන ප්‍රදාන ලෙස නිවැරදිව ගිණුම්ගත කරන ලදි. | ගිණුම් ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළයුතු වේ. |
| (ආ) | ඉකුත් වර්ෂයේදී අරමුදල් ලැබී තිබුණු නමුත් ආරම්භ නොකරන ලද LDSP ව්‍යාපෘතියේ මාර්ග ඉදිකිරීම් අරමුදල් රු.3,743,300 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස අවස්ථා 02 කදී ගිණුම්ගත කර තිබුණි. | LDSP ව්‍යාපෘතිය සඳහා ලැබුනු ප්‍රදාන ජර්නල් සටහන් 04 හා 62 මඟින් අවස්ථා දෙකකදී ගිණුම්ගත වී තිබීම නිවැරදි කරන ලදි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. |
| (ඇ) | ඉකුත් වර්ෂයේදී ඉදිකරන ලද මාන්කඩවල කොක්කිච්චිය මාර්ගයට කුට්ටිගල් ඇතිරීමේ ව්‍යාපෘතියේ වියදම වූ රු.283,489 ක් අවස්ථා 02 කදී ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර තිබුණි. | විස්තීර්ණ ආදායමේ හඳුනාගන්නා ප්‍රමාණය වැඩියෙන් හඳුනා ගැනීම නිවැරදි කරන ලදි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. |
| (ඇ) | ඉකුත් වර්ෂයේදී හඳුනාගත් වත්කම් මත පුනරාවර්තන නොවන වියදම් සඳහා වන රජයේ මාරුකිරීම් අයභාරය රු.1,364,913 ක් වුවත් සමාලෝචිත වර්ෂයේදී ජ'නල් 4 හා 5 යටතේ නිවැරදි කරන ලද මුළු වටිනාකමින් සියයට 10 ක් ලෙස සලකා එය රු.1,652,944 ක් ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සඳහන් කර තිබුණි. | විස්තීරණ ආදායමේ හඳුනාගන්නා ප්‍රමාණය වැඩියෙන් හඳුනා ගැනීම නිවැරදි කිරීම් කරන ලදි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඉ) | මාර්ග, බෝක්කු හා මංමාවත් ඉදිකිරීම්වල සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය වටිනාකම රු.1,260,144 ක් වුවත් වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ රු.808,875 ක් ලෙස රු.451,269 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ක්ෂය අඩුවෙන් සටහන් කිරීම නිවැරදි කිරීම. | නිවැරදිව වියදම් ගිණුම්ගත කළයුතු වේ. |
| (ඊ) | LDSP ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේදී මාර්ග ඉදිකිරීම් සඳහා ලබාදුන් අත්තිකාරම් රු.168,861 ක් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර තිබුණි | පුනර්වර්තනවියදම් සඳහා ලබා දුන් අත්තිකාරම් මුදල ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම් ගත කර තිබීම නිවැරදි කිරීම. | අත්තිකාරම් ලබාදීම් ලැබිය යුතු ශේෂයන් ලෙස ගිණුම්ගත කළයුතු වේ. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2018 පෙබරවාරි 20 දිනැති අංක 03/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | විශ්‍රාමික තාක්ෂණික නිලධාරියෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන මාසික පාරිශ්‍රමිකය ලෙස රු.42,900 ක්ද නිවාඩු දින රාජකාරි සඳහා දීමනා ලෙස රු.99,200 ක්ද ගමන් ගාස්තු ලෙස රු.48,000 ක්ද ගෙවා තිබුණි. | තාක්ෂණ නිලධාරිවරියට සහ තාක්ෂණ සහායක නිලධාරීන් දෙදෙනාට රාජකාරි සියල්ල ඉටු කිරීමට අපහසු වූ බැවින් මෙම නිලධාරියා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද අතර සතියේ දිනවල ඉටුකළ නොහැකි රාජකාරි සඳහා නිවාඩු දින වෙනුවෙන් ගෙවීම් කරන ලදී. | චක්‍රලේඛය ප්‍රකාරව කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් විශ්‍රාමික නිලධාරියෙකුට මාසික පාරිශ්‍රමිකය පමණක් ගෙවිය යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අයභාරය ඉක්මවූ පුනරාවර්තන වියදම රු.12,587,583 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අයභාරය ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.13,086,813 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු රු1,.580,450 ක හිඟ කසළ බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කසළ බදු ගෙවන්නන්ගේ ලැයිස්තු පිළියෙල කරමින් පවතී. හිඟ අයකිරීම සඳහා කටයුතු කරමි. | ලේඛන විධිමත්ව නඩත්තු කර අතුරු ව්‍යවස්ථා පැනවීම හා ගාස්තු අයකිරීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) **කුලී** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.1,467,207 ක හිඟ කුලී අයකර ගැනීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී මුදල් කපාහැරීම සඳහා කටයුතු කරමින් පවතී. | හිඟ ආදායමේ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට LDSP ව්‍යාපෘතිය යටතේ හා ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද මාර්ග 02 ක් සඳහා රු.7,140,209 ක් වැයකර තිබුණු නමුත් එම ව්‍යාපෘතිවලින් අපේක්ෂිත නිමවුම් මට්ටම ලබාගෙන නොතිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට උපදෙස් ලබාදී ඇත. | බිල්පත් සහතික කිරීමට පෙර ව්‍යාපෘති භෞතිකව පරීක්ෂා කර බිල්පත් සහතික කිරීමට පියවර ගතයුතු වේ. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුර නැඟුමව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි 12 දින වනවිට ලැබී තිබුණු රු.2,505,266 ක් එම ව්‍යාපෘතිය සඳහා වැය නොකර සභාවේ නමින් රාජ්‍ය බැංකු ජංගම නිශ්කාර්යව පැවතුණි. | මෙම මුදල් පුරනැගුම ව්‍යාපෘතියට අදාළ මුදල් බැවින් ඒට අදාළ ගෙවීම් සිදු කිරීම සඳහා පුරනැගුම බැංකු ගිණුමෙහි තැන්පත් කර ඇත. | කෙටිකාලින ආයෝජන මාර්ගවල යෙදවීමට ක්‍රියාකළයුතු වේ. |
| (ආ) | සභාව සතුව පවතින වාහන 04 ක් වර්ෂ 01 -05 අතර කාලයක සිට අක්‍රීයව පැවතුණු නමුත් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියාවක් සිදුකර භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | කඩිනමින් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ඇ) | සභාවට අයත් ඇලයාපත්තුව සතිපොළ සහ බුලංකුලම සතිපොළ නිෂ්කාර්යව පවතින අතර එම ඉඩමේ වැට මායිම් සකස් කර ආරක්ෂා කර ගැනීම සඳහා සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | එම ස්ථාන ආරක්ෂා කිරීමට අවධානය යොමුකරන බව ප්‍රකාශ කරමි. | අදාළ වත්කම්වල ආරක්ෂාව සහතික කර වත්කම් බදුදීමට අවශ්‍ය කටයුතු කළයුතු වේ. |
| (ඈ) | සභාව සතු වටිනාකම රු.2,500,000 ක්වූ ගලි බවුසරය සහ ට්‍රැක්ටරය ගලි අපද්‍රව්‍ය බැහැර කිරීමට ස්ථානයක් නොමැතිවීම නිසා 2021 වර්ෂය පුරාවට නිශ්කාර්යව පැවතිණි. | අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ස්ථානයක් සකස් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සපයා දෙන ලෙස පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර ඇති බව කාරුණිකව දන්වමි. | ගලි යන්ත්‍රය භාවිතයට ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | වටිනාකම රු. 90,690,000 ක්වූ ඉඩම් කැබලි 109 ක් සඳහා පැවරුම් සහතික ලබාගෙන නොතිබුණි. | ඉඩම් පවරා ගැනීම් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් ඉල්ලීම් සිදුකර ඇත. | පවත්නා වත්කම් තහවුරු කර ගැනීම් සඳහා අවශ්‍ය තොරතුරු ලබාගත යුතු වේ. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන - 2021 යටතේ නොවැම්බර් 30 දිනට නිමකළයුතු ව්‍යාපෘති 75 කින් 13 ක පමණක් වැඩ අවසන් කර තිබුණි. | ව්‍යාපෘති 75න් ව්‍යාපෘති 13 ක වැඩ අවසන් ඇති අතර අනෙක් ව්‍යාපෘති සඳහා ගිවිසුම් ගත නොවූ බව කාරුණිකව දන්වමි. | සැලසුම් කළ ව්‍යාපෘති වර්ෂය තුළ ආරම්භ කර නිමකිරීමට කටයුතු කළයුතු වේ. |